# කථාවත්ථුප්පකරණය අභිධර්මපිටකයෙහි ලා සඞ්ග්‍රහ කළ හැකි ද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පූජ්‍ය, ඕපාත සමිත හිමි[1]

## හැඳින්වීම

බුද්ධපරිනිර්වාණයෙන් අනතුරු ව තථාගතවචනය විවිධ විභජනයන්ට ලක් විය. තෙවන ධර්මසඞ්ගායනාවේ දී ධර්මය සූත්‍ර, විනය, අභිධර්මය ලෙස වර්ගීකරණය කිරීම ඉන් එක් අවස්ථාවකි. මෙම වර්ගීකරණයන්ට සූත්‍ර හා විනයට අමතර ව අභිධර්මය යනුවෙන් තෙවන පිටකයක් එක්වීම අද්‍යතනයේ පවා විවාදයට ලක්වන කරුණකි. මුල් බුදුසමයේ දී නවඞ්ගසත්ථුසාසනය මඟින් බුද්ධවචනය වර්ගීකරණය කර ඇති නමුත් එහි ද අභිධර්මය යනුවෙන් ධර්ම කොට්ඨාසයක් සඳහන් නො වේ. එහෙයින් අභිධර්මය වෙන ම පිටකයක් බවට පත් කිරීම විවාදාපන්න කරුණකි. අභිධර්මපිටකය පූර්ණ පිටකයක් බවට පත් වන්නේ මොග්ගලීපුත්තතිස්ස හිමි කථාවත්ථුප්පකරණය රචනා කිරීමත් සමඟිනි. ඒ තෙවන සඞ්ගායනාවේ දී ය. කථාවත්ථුව රචනා කිරීමත් සමඟ සිදු වූ අනෙක් වැදගත් කරුණ නම් ථෙරවාද සම්ප්‍රදායට අභියෝගාත්මක ව නැඟී සිටි නිකායාන්තරික මතවාදයන්ට මනා පිළිතුරක් ලැබීම ය. ඒ අනුව  සාකච්ඡාවට ගැනුණ වාදකථා සියල්ල දෙසියදාහතකි. අනෙක් අභිධර්ම කෘති හයෙන් කථාවත්ථුව වෙනස් වන්නේ ද මෙම වාදකථා හේතුවෙනි. ධම්මසඞ්ගණී ආදී සෙසු අභිධර්ම කෘතීන්හි මූලික ධාරණාව අභිධර්ම කාරණා විවරණය කිරීමට යොදාගෙන තිබුණ ද කථාවත්ථුව පරිශීලනය කිරීමෙන් එවැන්නක් දෘශ්‍යමාන නො වේ. එහෙයින් අන්තර්ගත කරුණු සලකා බැලීමෙන් කථාවත්ථුප්පකරණය අභිධර්ම කෘතියක් ලෙස සාධාරණීකරණය කළ හැකි ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් සිදු කෙරේ.

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයෙ 'දී කථාවත්ථුප්පකරණයේ අන්තර්ගතය හා රචනා ශෛලිය ආභිධම්මික විග්‍රහයක් ලෙස සාධාරණීකරණය කළ හැකි ද යන්න අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණ යි. එමෙන් ම කථාවත්ථුප්පකරණයේ තාර්කික ක්‍රමවේදය හා අන්තර්ගතය පිළිබඳ පර්යේෂණ කිහිපයක් සිදු වී තිබුණ ද එය අභිධර්ම කෘතියක් ලෙස කොතෙක් දුරට ප්‍රාමාණික වේ ද යන්න පිළිබඳ අඩු අවධානයක් යොමු  වී ඇති හෙයින් ඊට ඌනපූරණයක් සැපයීම  මෙම පර්යේෂණයෙහි තවත් එක් අරමුණක් වෙයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙය මූලික වශයෙන් පුස්තකාල අධ්‍යයන පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරන අතර, ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කෙරේ. ඒ අනුව කථාවත්ථුප්පකරණය හා තත් අටුවාව ප්‍රාථමික මූලාශ්‍රය

[1]. උපාධි අපේක්ෂක (විශේෂවේදී තෙවන වසර), පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

ලෙසත් ශාස්ත්‍රීය ලිපිලේඛන, සඟරා, කෘති හා විශ්වසනීය අන්තර්ජාල තොරතුරු ද්විතීයක මූලාශ්‍රය ලෙසත් භාවිත කෙරේ.

**පර්යේෂණ ගැටලුව**

ථෙරවාද අභිධර්මපිටකයෙහි ලා කථාවත්ථුප්පකරණය අන්තර්ගත කළ හැකි ද? යන්න මෙහි මූලික පර්යේෂණ ගැටලුව යි.

**පර්යේෂණ සාහිත්‍ය සමීක්ෂාව**

මෙම පර්යේෂණයේ පදනම අභිධර්මපිටකාගත කථාවස්තුප්‍රකරණය යි. කථාවත්ථුවේ සන්දර්භය අධ්‍යයනය කරමින් එය කොතෙක් දුරට අභිධර්ම කෘතියක් ලෙස හැඳින්වීම සාධාරණ ද යන්න පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක් සිදු වී නොමැති තරම් ය. එහෙත් කථාවත්ථුවේ අන්තර්ගතය හා එහි සඳහන් තාර්කික ක්‍රමවේද පිළිබඳ ව තරමක් දුරට පර්යේෂණ සිදු වී ඇත. ඒ අතුරින් පල්ගමුවේ සුධීරානන්ද හිමියන් (2012) අභිධර්ම සම්භාවනා නම් සප්තප්‍රකරණ ධර්මසඞ්ග්‍රහයට සපයන ලද ශාස්ත්‍රීය ලිපියෙහි **කථාවත්ථුවේ සන්දර්භය හා තර්කය ක්‍රමවේදය** පිළිබඳ ව සාකච්ඡා කර ඇත. මීට අමතරව, පටිපදා (2016) ශාස්ත්‍රීය සඞ්ග්‍රහයේ මහාචාර්ය, අසංග තිලකරත්න **කථාවත්ථුවේ අන්තර්ගත වාදක්‍රම හා තාර්කය සිද්ධාන්ත,** ඇකිරියගල නන්ද හිමි **කථාවත්ථුවේ පරවාද ප්‍රතිබාහනය,** විජිතපුර ගුණරතන හිමි **කථාවත්ථුවේ වාද ස්වරූපය,** සමන්ත ඉලංගකෝන් **කථාවත්ථුවේ තර්කය** යන ප්‍රස්තුත ඔස්සේ අධ්‍යයනයක යෙදී ඇත. කථාවත්ථුප්පකරණය පිළිබඳ ව අධ්‍යයනය කරන ලද බොහෝ දෙනා අවධානය යොමු කර ඇත්තේ එහි සඳහන් තාර්කික ක්‍රමවේදය කෙරෙහි මිස අන්තර්ගත කරුණු කෙතෙක් දුරට ආභිධම්මික ප්‍රස්තුතයට ගැළපේ ද යන්න පිළිබඳ නො වේ.

**පර්යේෂණ සීමාව**

ථෙරවාද ත්‍රිපිටකය හා තදට්ඨකථාව මෙහි පර්යේෂණ සීමාව යි.

**පර්යේෂණ සාකච්ඡාව**

අභිධර්මපිටකය සඳහා එක් වූ අවසාන කෘතිය කථාවත්ථුප්පකරණය යි. කල් ගතවීමත් සමඟ සසුන තුළ ඇති වූ දුර්මත ස්වීයත්වයෙන් ගත් භික්ෂු පිරිස් ඒ ඒ මත බුද්ධභාෂිතය යැයි ප්‍රකාශ කිරීම නිසා ඒ සඳහා පිළිතුරු ලබා දීමක් වශයෙන් තෘතීය සඞ්ගායනාවේ දී මොග්ගලීපුත්තතිස්ස තෙරණුවෝ කථාවත්ථුව රචනා කළහ. ඒ ථෙරවාද සම්ප්‍රදායෙහි එන අභිධර්ම කෘතියක් සඳහා කර්තෘත්වය හිමි වූ මුල් ම කෘතිය වශයෙනි. අභිධර්මපිටකාගත කෘති සියල්ලෙහි අන්තර්ගතය සැකෙවින් අධ්‍යයනය කිරීමෙන් කථාවත්ථුප්පකරණයෙහි සුවිශේෂී වෙනස්කම් සොයාගත හැකි ය. කථාවත්ථුවෙන් පරිබාහිර අන් සියලු ම ප්‍රකරණ ග්‍රන්ථයන්හි සෘජු ව ම සාකච්ඡා කෙරෙනුයේ ධර්මමය කාරණාවන් ය. එම කරුණු සෘජුවම චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ යන සතර පරමාර්ථ ඉලක්ක කරගත් ඒවා ය. එහෙත් කථාවත්ථුවෙහි දී සෙසු අභිධර්ම කෘතීන්හි සාකච්ඡා වී ඇති ධර්මමය ප්‍රස්තුතයන්ට වඩා පශ්චාද්කාලීන ව විවිධ නිකායන් ඇතිවීමට තුඩු දුන් කරුණු සාකච්ඡා වේ. ඒ අතුරින් රහතන් වහන්සේ රහත් බවින් පිරිහේ ද? දෙවියන්

කෙරෙහි බ්‍රහ්මචර්යා වාසයක් නැති ද? බුදුවරුන්ගේ ඥානය ශ්‍රාවක සාධාරණ වේ ද? බුදුවරුන් විෂයෙහි දෙන දානයේ ආනිසංස මහත්ඵල වේ ද? ආදිය ප්‍රධාන ය. මෙම කරුණුවලට අනුව පැහැදිලි වන්නේ කථාවත්ථුව නිර්වාණ සාධනීය වූ ධර්මමය විවරණයෙන් බැහැර ව එවකට සසුන තුළ ඇති ව තිබූ දුර්මත ප්‍රහාණයට වැඩි ඉඩක් ලබා දී ඇති බව යි. මීට අමතර ව කථාවත්ථුව රචනා කිරීමේ දී යොදාගත් රචනා ශෛලිය ද අනෙකුත් කෘති හයට සාපේක්ෂ ව වෙනස් ස්වරූපයක් ගනී. කථාවත්ථුවේ ඇතුළත් වන්නේ සංවාදශීලී භාෂාශෛලියකි. මෙම සංවාදශීලී ස්වරූපය පාලි මිලින්දපඤ්හයේ එන මිලිඳු-නාගසේන සංවාදය ස්වරූපය හා සමාන බවක් උසුලයි. එහෙත් ධම්මසඞ්ගණී ආදී ප්‍රකරණ හයෙහි සුත්තන්තමාතිකා, අභිධම්මමාතිකා, උද්දෙස, නිද්දෙස ආදී පොදු ක්‍රමවේදයක් යටතේ කරුණු සඞ්ගෘහිත ය. මේ අනුව කථාවත්ථුව අනෙකුත් අභිධර්ම කෘති හයෙන් ඉඳුරා ම වෙනස් වන හෙයින් මෙම කෘතිය අභිධර්මපිටකයට නො ව අන්‍ය පිටකයකට ඇතුළත් කිරීම වඩාත් ශාස්ත්‍රීය ය.

**පර්යේෂණ නිගමනය**

කථාවත්ථුවෙහි අන්තර්ගත කරුණු හා රචනා ශෛලිය අනෙකුත් අභිධර්ම කෘති හය සමඟ නො ගැළපුන ද එය පශ්චාත් පේටක ප්‍රාග් අටුවා යුගයේ රචනා වූ මිලින්දපඤ්හය සමඟ අත්‍යන්තයෙන් සැසඳේ. කථාවත්ථුව ද මීට සමාන අවදියක රචනා වීම නිසා මෙම කෘති දෙකෙහි ම එවකට සසුන තුළ උද්ගත ව පැවති දුර්මත සාකච්ඡාවට බඳුන් කරන්නට ඇත. මිලින්දපඤ්හය පශ්චාත් පේටක ප්‍රාග් අටුවා යුගයේ රචනා වූ නමුත් බුරුම හා තායි බෞද්ධ සම්ප්‍රදාය මෙම කෘතියෙහි අන්තර්ගත කරුණු ආදිය සලකා බලා බුද්දකනිකායට ඇතුළත් කොට ඇත. මේ අනුව කථාවත්ථුව තුළ අභිධර්ම කාරණා සාකච්ඡා නො වීම හා රචනා වූ කාලසීමාව, භාෂාශෛලිය යන කරුණු සලකා බලා මෙය වඩාත් උචිත වන්නේ අභිධර්මපිටකයට ඇතුළත් කිරීම නො ව බුද්දකනිකායට ඇතුළත් කිරීම යි.

**ප්‍රමුඛ පදඃ** අභිධර්මපිටකය, කථාවත්ථුප්පකරණය, බුද්දකනිකාය, මිලින්දපඤ්හය

**මූලාශ්‍රය**


- **කථාවත්ථුප්පකරණය I.** (2006). බුද්ධජයන්ති පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **කථාවත්ථුප්පකරණය III.** (2006). බුද්ධජයන්ති පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **ධම්මසඞ්ගණිප්පකරණය.** (2006). බුද්ධජයන්ති පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **ධාතුකථාප්පකරණය.** (2006). බුද්ධජයන්ති පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- ආනන්ද මෛත්‍රෙය හිමි, බලන්ගොඩ (සංස්.). (1962). **මිලින්දපඤ්හ.** අනුල මුද්‍රණාලය.
- සුධම්මාලඞ්කාර හිමි, විල්පිට (2011). **බුද්දකනිකාය විමංසා.** කර්තෘ ප්‍රකාශන.